# ගොවි දුක නිවන ගල්ගමුව

## සුළු ගොවීන් රකින අත්හදා බැලීමක්

පර්යේෂණ හා පුහුණු කිරීමේ
නිලධාරි
**රංජිත් කුමාරසිරි පතිරණ**
විසිනි

ලොව වෙසෙන ජනගහණයෙන් 76% ක් ග්‍රාමීය නිෂ්පාදනයෙහි යෙදී සිටිති. ශ්‍රී ලංකාවේ ජනගහණයෙන් සියයට 80 ක් පමණ ගම්බද ජීවත් වෙන අතර මින් 55% ක් පමණ කෘෂිකර්මාන්තය ගම ජීවානෝපාය කර ගෙන සිටිති.මේ අනුව ගොවියා ශ්‍රී ලංකා ආර්ථිකයෙහි ප්‍රධාන තම නිෂ්පාදකයා මෙන්ම ආර්ථිකයෙහි හරයද වන්නේය.

මෙය පදනම් කරගෙන ගොවියා දිරිමත් කිරීම, සහන සැලසීම, යෙදවුම් කලට වේලාවට ලබාදීම, නව තාක්ෂණය කෙරෙහි ඔහු යොමු කරවීම මෙන්ම ඔහුගේ සමූහ සංස්කෘතික භාවය වර්ධනය කිරීමද ශ්‍රී ලංකාවේ ආර්ථික පසුබිම ශක්තිමත් කරන්නක් වශයෙන් මෙන්ම සමාජ වර්ධනය සිදුකරන්නක් ලෙසද දැක්විය හැක.

ශ්‍රී ලාංකික ගොවි ජනතාවගේ ආර්ථික හා සමාජ සහයෝගිතාවය ඇති කිරීමේදී යම් යම් බාධාවන් ඇතැයි කාලයක් තිස්සේ සිට කරන ලද විවිධ පර්යේෂණ තුළින් හැඟී ගිය කරුණකි. අතර මැදියකුගේ සූරාකෑමට ලක්වීම, නව තාක්ෂණය භාවිතා කිරීමට ඔහු දක්වන අඩු උනන්දුව හා ඌන අධ්‍යාපන තත්වය මෙන්ම ඔහු වෙනුවෙන් තීරණ, සාධකයෙකු වශයෙන් පෙනී සිටින නිලධාරියා හා ගොවියා අතර ඇති සංස්කෘතිකමය පරතරයද බෙහෙවින් මෙයට හේතුවී ඇතැයි සොයා ගෙන ඇත.

මේ කරුණු සියල්ල ඉතා සැලකිල්ලෙන් හා විද්‍යාත්මක ස්වරූපයෙන් තේරුම් ගත් ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මගින් මෙම කුඩා පරිමාණ ගොවි සංවිධාන සංකල්පය හඳුන්වා දීම කරන ලදී. මෙම සංකල්පය ප්‍රයෝජනයට ගනිමින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව නියාමක ප්‍රදේශයේ මෙම කුඩා පරිමාණ ගොවි සංවිධාන පිහිටුවන ලදී. ගල්ගමුව ගොවිජන සේවා කොට්ඨාශය තුළ වෙල් විදනේවරු 61 දෙනෙකි. මින් 44 දෙනෙකුගේ නායකත්වය යටතේ කුඩා පරිමාණ ගොවි සංවිධාන පිහිටුවන ලදී. මෙම ගොවි සංවිධාන වැඩ පිළිවෙලට ආසන්න වශයෙන් පවුල් 1500 ක් පමණ සම්බන්ධ වී ඇති අතර ඔවුන් සතුව ඇති ඉඩම් ප්‍රමාණය අක්කර 3500 ක් පමණ වෙයි.

කුඩා පරිමාණ ගොවි සංවිධාන වල නායකයා වශයෙන් ක්‍රියා කරන වෙල්විදනවරු වරින් වර ගොවි ජනසේවා මධ්‍යස්ථානයට කැඳවා විවිධ කෘෂි ක්ෂේත්‍රයන් පිළිබඳ පුහුණුවීම් දෙනු ලබයි. වාරිමාර්ග පාවිච්චි කිරීම,කෘෂිකාර්මික පොල් සංවර්ධනය, සුළු අපනයන භෝග වගාව සත්ව පාලනය මෙන්ම ආයතනික ණය ලබා ගැනීම, ඉතිරි කිරීමේ වැදගත්කම ආදිය පිළිබඳ වද ඔවුනට අවබෝධයක් ලබාදීම සිදුවේ. එමෙන්ම ගොවියා තමන්ගේ නිර්මාණාත්මක විවේකයේදී තම සහෝදර ගොවියන් සමග එකමුතුව සමූහ සංස්කෘතික භාවය තුළින් තමන්ගේ ප්‍රශ්න විසඳ ගන්නේ කෙසේද? යන්න පිළිබඳව මෙමගින් අවබෝධයක් ලබාදෙනු ලැබේ.

මෙම කුඩා පරිමාණ ගොවි සංවිධාන මසකට වරක් රැස්වන අතර එහිදී ගොවි නියෝජිතයා (විදනේ) විසින් පුහුණුවෙන් හා අත්දැකීමෙන් ලබාගත් දැනුම තම සහෝදර ගොවීන් වෙත ලබාදීම සිදුවේ. එහිදී තමන්ගේ ක්ෂේත්‍ර මට්ටමේ ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා කරන අතර ගොවි සංවිධාන වලදී ගනු ලබන තීරණ කමිටුව වෙත දැනුම්දී ඒ ඒ ප්‍රශ්න කෙරෙහි අදාළ ක්ෂේත්‍ර නිලධාරින් ගෙන් එයට විසඳුම් ලබා ගැනීම සිදුවේ. මේ අනුව ගොවි නියෝජිතයා වශයෙන් පෙනී සිටින වෙල් විදනේ සංනිවේදයකු වශයෙන් කටයුතු කරනු පෙනේ.

ගොවිජන සේවා කොමිටියත් ගොවි සංවිධානයත් අතර පවතින සංනිවේදන රටාව පහත සඳහන් ආකාරයට සකස්වී ඇත.

කමිටු නියෝජනය කරන ඒ ඒ විෂය බාර නිලධාරින්

1 2 3 4 5 6 7 8

ගොවිජන සේවා කමිටුව

1 2 3 4 5 6

ගොවි නියෝජිතයන්
ගොවි සංවිධානයන්

මෙම කුඩා පරිමාණ ගොවි සංවිධාන නියාමක ව්‍යාප්තිය මගින් දනට තෙලා ගෙන ඇති ප්‍රතිඵල රාශියකි. 1980–1981 මහ කන්නය සඳහා අත්හද බැලීමක් වශයෙන් ගොවි සහභාගීත්වයෙන් යුතු නිෂ්පාදන සැලැස්මක් සම්පාදනය කිරීම මෙහිදී වැදගත්ය. සමූහ සංස්කෘතික භාවයට මුල් තැන දෙමින් ඒ ඒ බිම්වලට අවශ්‍ය කරන බිත්තරවී, පොහොර වර්ග යෙදීමට පොදු එකඟත්වය කට එළඹීම හා ඒ ඒ ක්ෂේත්‍ර බාර නිලධාරීන් ලවා එම කට යුතු කර ගැනීමට හැකිවීම මෙහිදී කැපී පෙනෙන්නක් විය.

මෙම කුඩා පරිමාණ ගොවි සංවිධාන වල නිර්දේශය පරිදි ගොවින් 51 දෙනෙකුට රුපියල් 6300 බැගින් ණය මුදල් ලබාගැනිමට හැකිවීම දක්විය හැකි තවත් ප්‍රතිඵලයකි. ගොවි කටයුතු පර්යේෂණ ආයතනය ලංකා බැංකුව සමග කළ සාකච්ඡාවක ප්‍රතිඵල යක් වශයෙන් මෙය සිදුවූ අතර මෙම ණය ලබාදීමේ සාර්ථක තත්වය තවත් කැපී පෙනෙන්නේ ණය ලබා දුන් ගොවීන් ගෙන් 100%ක් දෙනා ඒවා ආපසු ගෙවූ හෙයිනි.

ගල්ගමුව ගොවිජන සේවා කොට්ඨාශයට අයත් ප්‍රදේශයේ ගැමියන්ගේ ඉතිරි කිරීමේ පුරුද්ද වර්ධනය කිරීමද මෙම ව්‍යාප්තිය මගින් කළ සේවයක් ලෙස දක්විය හැක. ගොවියා නිරන්තර යෙන්ම ඉතිරි කිරීමට කැමැත්තක් නොදක්වයි. මෙයට හේතු දෙකක් ඇත. එකක් නම් ඔවුන්ගේ ආර්ථිකය ස්ථාවර තත්වයක නොමැති හෙයින් ඔහුට ඉතිරි කිරීමට අපහසු බවයි. දෙවැන්න නම් ඔහුට ඒ පිළිබඳව අවබෝධයක් නොමැති කමයි. මේ අනුව මෙම ගොවි සංවිධාන මගින් ඒ ඒ සංවිධානයේ පොදු ගිණුමකට ශත 25ක සිට රු: 1 දක්වා මුදලක් ඉතිරි කිරීමට ගොවියන් යොමු කිරීමට සිදුවිය. 1981 ජූලි මස වනවිට මෙම සුළු ඉතිරි කිරීම මගින් තැන්පත්වී තිබූ සම්පූර්ණ මුදල රු: 3000 ඉක්මවා තිබුණ.

කුඩා පරිමාණ ගොවි සංවිධාන නියාමක ව්‍යාප්තිය පිළිබඳව අව සාන වශයෙන් සමාලෝචනය කිරීමේදී මෙමගින් ඉටුවන ප්‍රධාන කාර්යයන් දෙකක් අපට පෙන්වා දිය හැකිය. ගොවීන් තමන්ගේ පොදු සහභාගිත්වය යටතේ කෘෂි ජීවිතයේදී තමන්ට මුහුණ දීමට සිදුවන ප්‍රශ්න විසඳ ගැනීම මෙහිදී සිදුවේ. මෙම තත්වය පදනම් කර ගෙන ගොවීන්ගේ ආර්ථික සහ යෝගිතාවය එක් පැත්තකින් ගොඩ නැගෙන අතර ඒ තුළින් ඔහුගේ සමාජ සහයෝගිතාවය ද ගොඩ නැගේ.

# සිතියමට නෙත් යොමන්

සිතියමට නෙත් යොමින්,
ඔබ දකිනු ඇත, එවිට,
මසුන් පිරි ගඟින් යුතු,
බෝගයට උචිත වූ බිමෙන් සරු,
කිරින් පැණියෙන් පිරුණු,
ඛණිජ සම්පතින් කලුවන් වූ කඳු ශිඛර ඇති,
සම්පතින් පිරුණු රමණීය දිවයිනක්
එසම්පත් වලින් පල ලබනු රිසිවූ
දශ ලක්‍ෂ දහතක ජනතාවක්.
යොමන විට සිතියමට නෙත්,
ඔබට නොපෙනේය සොඳුරු බව මගෙ රටෙහි,
මහා මුඩු බිමක සිටින,
දශ ලක්ෂ දහතක ජනකායක්,
ඔවුන් දුබලයයි ලෝකයා කියත්...................

කැඳවීම් වලින්, ටැන්සානියාවෙන් නව කවි
(සංස්කාරක රිචඩ් මබාලා)

කාව්‍ය සංග්‍රහයේ පළවූ එරට තරුණ කවියෙකුවන
'කාජුබගේ' නිර්මානයක්.

පරිවර්තනය – ගුණරත්න රාමනායක.